සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

# Third Term Test - Grade 13 - 2016

විභාග අංකය ............................ **ගිණුම්කරණය II** කාලය පැය තුනයි

**උපදෙස්**

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හයක ට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාල පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

01. 2016 මාර්තු 31 දිනට ජනහිත පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

(රු.000)

| | | |
|---|---|---|
| දේපල,පිරියත හා උපකරණ (පිරිවැය) ......................... | 9700 | |
| දේපළ,පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය ............... | | 3200 |
| විකුණුම් පිරිවැය ............................................................. | 6800 | |
| වෙළඳ ලැබිය යුතු දෑ .................................................... | 1050 | |
| ප්‍රත්‍යාගණන සංචිතය (2015.04.01) ............................. | | 800 |
| කල්බදු පොලි .................................................................. | 1440 | |
| කල්බදු ණය හිමියෝ ..................................................... | | 2494 |
| තොගය(2016.03.31දිනට) ................................................ | 800 | |
| දිගුකාලීන ආයෝජන(පිරිවැය) ....................................... | 3000 | |
| ස්ථාවර තැන්පත් ............................................................ | 700 | |
| බැංකුවේ ඇති මුදල් ...................................................... | 2000 | |
| වැටුප් ................................................................................ | 1000 | |
| සේවක අර්ථ සාධක අරමුදල් (EPF) වියදම් .............. | 150 | |
| සේවක භාරකාර අරමුදල්(ETF) වියදම් ..................... | 30 | |
| පරිත්‍යාග .......................................................................... | 80 | |
| බෙදාහැරීමේ වියදම් ...................................................... | 250 | |
| දුරකථන ගාස්තු .............................................................. | 35 | |
| විදුලිය ............................................................................... | 71 | |
| විකුණුම් ........................................................................... | | 12850 |
| 2015/2016 වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු .............. | 250 | |
| ගෙවූ අතුරු ලාභාංශ .................................................... | 640 | |
| ලද වට්ටම් ....................................................................... | | 100 |
| ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් (2016.03.31 දින ආයෝජනය කරන ලද)...................... | 2850 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් ........................ | | 5000 |
| රඳවාගත් ඉපැයුම් (2015.04.01දිනට) ............................. | | 6000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ .................................................... | | 332 |
| අඩමාන ණය වෙන් කිරීම (2015.04.01 දිනට ) ........... | | 70 |
| | **30846** | **30846** |

2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

(i) විකිණීමේ හෝ ආපසු එවීමේ පදනමට යවා ඇති 2016.03.31 දිනට ආපසු එවීමේ දින ඉකුත් නොවූ බෙදාහරින්නන් වෙත පැවති තොගයේ ඉන්වොයිස් මිළ රු.250000 කි. මෙම භාණ්ඩ බෙදාහරින්නන් වෙත නිකුත් කිරීමේදි සමාගම ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත. මෙම තොග පිරිවැයට 25% ක ආන්තිකයක් එකතු කර ඉන්වොයිස් කර ඇති අතර අවසාන තොගය ආගණනයේ දී මෙය මගහැරී ඇත.

(ii) 2015.04.01 දිනට දේපළ,පිරියත හා උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂය වල සංයුතිය පහත පරිදි වේ.

| වත්කම | පිරිවැය/ප්‍රත්‍යාගණන අගය(රු.000) | සමුච්චිත ක්ෂය (රු.000) |
|---|---|---|
| ඉඩම | 1000 | -- |
| ගොඩනැගිලි | 2000 | -- |
| මොටර් රථ (කල්බදු පදනමට) | 6000 | 3000 |
| කාර්යාල උපකරණ | 700 | 200 |
| | 9700 | 3200 |

- 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුල දේපල පිරියත හා උපකරණ මිළදී ගැනීමක් හෝ විකිණීමක් සිදු නොවීය.
- 2015.03.31 දින සමාගම සතු ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කළ අතර එමගින් රු.800000 ක ප්‍රත්‍යාගණන ලාභයක් ඇති විය. ශේෂ පිරික්සුමේ ප්‍රත්‍යගණන සංචිතයෙන් දැක්වෙන්නේ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් හටගත් එම ප්‍රත්‍යාගණන ලාභයයි.
- 2016.03.31 දින සමාගම සතු ගොඩනැගිලි නැවත රු.1000000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මේ සම්බන්ධයෙන් පොත් වල කිසිවක් සටහන් කර නැත.
- 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ හැර අනෙකුත් දේපළ පිරියත හා උපකරණ වලට අදාල ක්ෂය ප්‍රමාණයන් පහත දැක්වේ.

| | (රු.000) |
|---|---|
| ගොඩනැගිලි | 50 |
| කාර්යාල උපකරණ | 40 |

(iii) 2013.04.01 දින මෝටර් රථය මූල්‍ය කල්බද්දක් යටතේ වසර 4 ක කාලයකට භාණ්ඩ බෙදාහැරීම සඳහා අත්පත් කරගෙන ඇත. ගෙවිය යුතු වාර්ෂික කල්බදු වාරිකය රු.1440000 කි. ප්‍රවර්ථන වර්ෂයේ කල්බදු වාරිකය ගෙවා ඇති අතර එය කල්බදු පොලී ගිණුමට හරකර ඇත. වාර්ෂික කල්බදු පොලි පහත පරිදි. වේ.

| වසර | පොලිය(රු.000) |
|---|---|
| 2013/2014 | 460 |
| 2014/2015 | 358 |
| 2015/2016 | 250 |
| 2016/2017 | 136 |

මෙම වත්කමේ ඵලදායි ජීව කාලය වසර 5 කි. කල්බදු කාලය අවසානයේදි වත්කමේ අයිතිය කල්බදු ගැණුම්කරුට මාරු නොවේ.

(iv) සමාගම 2015.04.01 දින වර්ෂ 5 ක් සඳහා ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ අතර වාර්ෂික පොලි අනුපාතය 10% කි.

(v) 2016 මාර්තු මාසය සඳහා සේවකයින්ගේ දළ වැටුප රු.300000 ක් වූ අතර එය වාර්තාකර නොමැත. EPF සඳහා සේව්‍ය හා සේවක දායකයන් පිලිවෙලින් 15% ක් හා 10% ක් වන අතර ETF දායකය 3% ක් වේ. EPF හා ETF දායකයන් සේවක දළ වැටුප මත ගණනය කරනු ලැබේ. සේවක වැටුප් EPF දායකයන් හා ETF දායකයන් ඊළඟ මාසයේදි ගෙවීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(vi) 2016.03.31 දිනට පවතින වෙළඳ ලැබිය යුතු දැ ශේෂය මත 10%ක අඩමාන ණය වෙන් කිරිමෙක් සිදුකළයුතු වේ.

(vii) 2015/2016 වර්ෂය සඳහා ආදායම් බද්ද බදු පෙර ලාභයෙන් 25% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) 2015.04.01 දිනට නිකුත් කළ සාමාන්‍ය කොටස් ගණන 100000 ක් වූ අතර 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සෑම සාමාන්‍ය කොටස් 5 කට 1 බැගින් කොටසක් රු.50 ක ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් සිදුකරන ලදි. සියළු සාමාන්‍ය කොටස් හිමියන් හිමිකම් නිකුතුව භාවිතයට ගෙන මුදල් නිසි පරිදි සමාගමට ගෙවන ලද අතර එය නියමිත පරිදි වාර්තා කර ඇත.

(ix) 2016.03.31 දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු.200000 න අවසන් ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා කර ඇත

**අවශ්‍ය වන්නේ,**

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත ජනහිත පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද ඇතුළුව)

1 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

3. 2016.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය (ලකුණු 20)

02. (අ) මධුරංග හා මියුරංග විසින් 3.2 අනුපාතයට ලාභලාභ බෙදා ගනිමින්, හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබූ අතර 2016 මාර්තු 31 දින මියුරංග හවුලෙන ඉවත්වීම නිසා, විදුරංග නව හවුල්කරුවකු ලෙස බඳවා ගනිමින් හවුල් ව්‍යාපාරය තව දුරටත් පවත්වාගෙන යාම සිදුවිය. විදුරංග තම ප්‍රාග්ධනය හා කීර්තිනාම කොටස වශයෙන් රු. 75,000 ක් වටිනා තම මෝටර් රථය ව්‍යාපාරයට පවරා දෙන ලද නමුත් මේ සම්බන්ධයෙන් පොතවල කිසිම සටහනක් තබා නැත. එදින ඔවුන් පහත තීරණ වලට එළඹිණි.

i. මධුරංග හා විදුරංග පිළිවෙළින් 2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීම

ii. සියලුම හවුල්කරුවන්ට පැරණි ගිවිසුම පරිදිම,

1. ඔවුනගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂ වෙනුවෙන් 10% ක වාර්ෂික පොලියක් ගෙවීම

2. රු. 2000 ක් බැගින් මාසික වේතනයක් ගෙවීම.

iii. කීර්තිනාමය රු. 36 000 කට අගය කිරීම හා ප්‍රාග්ධන ගිණුම මගින් අවශ්‍ය ගැලපීම් කිරීම.

iv. මියුරංගගේ හිමිකම නිදහස් කිරීම සඳහා ව්‍යාපාරයේ පැවති මෝටර් රථය රු. 25 000 කට පවරා දීම හා ශේෂය 10% ණය ගිණුමකට මාරු කිරීම.

2016 03.31 දිනෙන් අවසන් වර්ෂයේ වෙළඳ ගිණුම පිළියෙල කිරීමෙන් පසු එදිනට ශේෂ පිරික්සුම පහත පරිදි දිස්වේ. (රු.000)

| | හර (රු) | බැර (රු.) |
|---|---|---|
| දළ ලාභය | | 228 |
| ඉතිරි තොගය (2016.03.31 ට) | 65 | |
| වෙළඳ ලැබිය යුතු හා වෙළඳ ගෙවිය යුතු දෑ | 41 | 38 |
| දේපල පිරියත උපකරණ ධාරණ වටිනාකම | 270 | |
| දේපල පිරියත උපකරණ මත ක්ෂය | 7 | |
| ගෙවිය යුතු විදුලිය (2015.04.01 ට) | | 2 |
| විදුලිය ගාස්තු | 10 | |
| 10% බැංකු ණය (2015.10.01 දින ලබාගත්) | | 40 |
| වැටුප් හා වේතන | 40 | |
| ප්‍රාග්ධන ගිණුම 2015.04.01 ට - මධුරංග | | 130 |
| මියුරංග | | 70 |
| ජංගම ගිණුම 2015.04.01 ට - මධුරංග | | 10 |
| මියුරංග | 2 | |
| මෙහෙයුම් වියදම් | 8 | |
| මුදල් හා බැංකු | 75 | |
| | **518** | **518** |

පසුව කරන ලද පරීක්ෂාවක දී පහත වැරදි සිදුව ඇති බව අනාවරණය විය.

i. ආපසු යැවුම් ගිණුමේ ශේෂය රු. 5 000 ආපසු එවුම් ලෙස ගණන් ගෙන ඇත.

ii. ගෙන යාමේ කුලි 3000 ක් ගෙන ඒමේ කුලී ගිණුමේ සටහන්ව තිබී ඇත.

iii. මධුරංග හා මියුරංග පිළිවෙලින් පිරිවැය රු. 8000 ක් හා 7000 ක් වූ භාණ්ඩ තොග ගැනිලි කර ඇති නමුත් මේ සම්බන්ධයෙන් කිසිම සටහනක් පොත්වල ඇතුළත්ව නැත.

පහත අතිරේක තොරතුරු ද සපයයි.

i. මියුරංගට පවරා දුන් මෝටර් රථයේ එදිනට ධාරණ අගය රු. 20,000 කි.

ii. මියුරංග තම වේතනය ලබාගත් අතර, එය වේතන ගිණුමේ සටහන්ව ඇත.

iii. විදුලිය ගාස්තුව තුළ පෙර වසර වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම හා ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවා ඇති විදුලි ගාස්තු 1000 ක් ඇතුළත් වේ.

**අවශ්‍ය වන්නේ,**

1. දළ ලාභය නිවැරදි කිරීමේ ප්‍රකශනය
2. 2016.03.31 දිනෙන් අවසන් වූ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ගේ විසර්ජනයන් ද සමඟ)
3. 2016.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම්

(ලකුණු 12 යි)

(ආ) සීමිත බීඩා සමාගම සෙල්ලම් කාර් නිපදවන ආයතනයකි. සමාගමේ නිමැවුම් හා එකලස් යනුවෙන් නිෂ්පාදන අංශ දෙකක් ද මෙම අංශ දෙක සඳහා සේවා සපයන ගබඩා අංශයක් ද පවතී. ඉදිරි කාර්තුව සඳහා ඇස්තමේන්තුගත පිරිවැය හා අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

i.

| | **නිමවුම් රු.** | **එකලස් රු.** | **ගබඩා රු.** |
|---|---|---|---|
| වක්‍ර ද්‍රව්‍ය | 55,000 | 40,000 | 10,000 |
| වක්‍ර ශ්‍රමය | 40,000 | 24,000 | 12,000 |

ii. වෙනත් පොදු කාර්ය පිරිවැය

| | රු. |
|---|---|
| කුලි හා වරිපනම් | 18,000 |
| සේවක සුභ සාධන | 27,000 |
| යන්ත්‍ර ක්ෂය | 32,000 |
| විදුලිය | 42,000 |

iii. අනෙකුත් තොරතුරු

| | නිමවුම් | එකලස් | ගබඩා |
|---|---|---|---|
| සේවක සංඛ්‍යාව | 450 | 270 | 90 |
| විදුලි ඒකක | 3,600 | 3,600 | 1,200 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 400,000 | 300,000 | 100,000 |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 18,000 | 12,000 | 6,000 |
| ද්‍රව්‍ය අධියාචනා පත්‍ර ගණන | 27 | 11 | |
| ශ්‍රම පැය | 15,000 | 6,000 | |
| යන්ත්‍ර පැය | 4,000 | 12,000 | |

iv. නිමවුම් අංශයේ පොදු කාර්ය පිරිවැය ශ්‍රම පැය පදනම මත ද එකලස් අංශය පොදු කාර්ය පිරිවැය යන්ත්‍ර පැය පදනම මත ද අන්තර්ග්‍රහණය කළ යුතුය.

v. සෙල්ලම් කාර් එකකට අදාළ තොරතුරු පහත දැක්වේ

| | | |
|---|---|---|
| ඍජු ද්‍රව්‍ය පිරිවැය | රු | 225 |
| ඍජු ශ්‍රම පිරිවැය | රු. | 175 |
| නිමවුම් අංශයේ ශ්‍රම පැය | | 6 |
| එකලස් අංශයේ යන්ත්‍ර පැය | | 4 |

**අවශ්‍ය වන්නේ,**

1. ප්‍රතිපාදනය, ප්‍රාථමික විභජනය හා ද්විතික විභජනය දක්වන පොදු කාර්ය පිරිවැය විභජන වාර්තාව
2. එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත
3. සෙල්ලම් කාර් එකක නිෂ්පාදන පිරිවැය (ලකුණු 08 යි)

(මුළු ලකුණු 20 යි)

03. සුරංගගේ සිල්ලර වෙළඳ සැලේ 2016.04.01 දිනට ඉඩම් හා ගොඩනැගිලි හා 200,000 ක්, ලී බඩු රු. 30,000 ක් බැංකු ශේෂය රු. 123,000 ක්, තොග රු. 20,000 ක්, ණයගැති - කමණී 12,000 ක් හා ණය හිමි - රවී රු. 10,000 ක් විය.

2016.04.01 දිනෙන් ආරම්භ වූ මාසයේ පහත ගනුදෙනු සිදුවිය.

i. අත්පිට විකුණුම් රු. 12,000 යි.

ii. සාගර ව්‍යාපාරයෙන් රු. 600,000 කට ත්‍රීරෝද රථයක් මිලට ගෙන රු. 50,000. චෙක්පතක් නිකුත් කර ශේෂය මාසයක් ඇතුළත ගෙවීමට එකඟ කර ගත්තා.

iii. සුධීරගෙන් ගැනුම් 30,000 යි. අත්පිට රු 20,000 යි. ශේෂය පසුව ගෙවීමට එකඟ කරවා ගත්තා.

iv. පියල්ට විකුණුම් 24,000 යි. අත්පිට රු. 14,000 ක් ලැබුණා. ශේෂය පසුව ලබා දීමට එකඟ විය.

v. 5% ක වට්ටම් අඩු කර ගෙන අංජන ට නිකුත් කළ රු. 9,500 ක් චෙක්පත අගරු වී ඇති බව ඔහු දැනුම් දුන්නා.

vi. කමණී ආපසු එවුම් 1,200 යි

vii. සුධීරට ආපසු යැවුම් රු. 2,000 යි

viii. ණය ගැති - කමණී රු. 800 වට්ටම් අඩු කරගෙන ශේෂය ව්‍යාපාර බැංකු ගිණුමේ තැන්පත් කර කවුලු පත එවා තිබුණා.

ix. ණය හිමි රවීට මුදල් ගෙව්වා 9,000 යි. ලද වට්ටම රු.1,000 යි.

x. සුරංග ලොතරැයි ජයග්‍රහනයෙන් ලද රු 10,000 ක මුදල ව්‍යාපාර කටයුතු වලට යෙදවිය.

xi. තම පෞද්ගලික ප්‍රයෝජනයට සුරංග රැගෙන ගිය තොගයේ පිරිවැය රු. 3,600 යි.

අතිරේක තොරතුරු

i. අප්‍රේල් මාසයේ විදුලි බිල රු. 2000 යි. මාසය අවසාන දින වන විටත් ගෙවා නැත.

ii. ත්‍රීරෝද රථය හා ලීබඩු වාර්ෂිකව පිළිවෙලින් පිරිවැයට 10% ක් 5% ක් බැගින් ක්ෂය කරයි.

iii. ව්‍යාපාරය හැම විටම පිරිවැයට 20% ක් ලාභයක් ලැබෙන පරිදි විකුණුම් මිල ලකුණු කරයි.

iv. සියළු මුදල් ගනුදෙනු බැංකු ගිණුම මගින් සිදු කරයි.

| ගනුදෙනු අංකය | වත්කම් | | | | හිමිකම් | | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපල පිරියත උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | බැංකු | ප්‍රාගධනය | + ආදායම් | -වියදම් | ණය | වෙළඳ ගෙවිය යුතු දෑ |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| | | | | | | | | | |

1. ඉහත 1 සිට 11 දක්වා ගනුදනුවල බලපෑම පමණක් දක්වන්න. ඒ සඳහා ඉහත දැක්වෙන ආකෘතිය යොදා ගන්න. අඩුවීමක දී වරහන් තුළ පෙන්වන්න.
2. 2016.04.30 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශය
3. 2016.04.30 දිනට හිමිකම සකස් වී ඇති ආකරය පෙන්වන්න. (ලකුණු 15 යි)

04. (අ) සීමිත පොවුන් සමාගමේ පහත තොරතුරු ඔබට සපයයි.

i. 2016.03.31 දිනට ණයගැති ලෙජර පාලන ගිණුමේ පහත ශේෂයන් දිස්විය.

| | | රු. 000 |
|---|---|---|
| 2015.04.01 දිනට | - හර ශේෂය | 300 |
| | - බැර ශේෂය | 50 |
| ණයට විකුණුම් | | 700 |
| දුන් වට්ටම් | | 10 |
| ණය ගැතියන්ගෙන් අය කිරීම් (ප්‍රමාද ගාස්තු) | | 5 |
| ආපසු එවුම් | | 20 |
| ණය ගැතියන්ගෙන් ලද මුදල | | 400 |
| ගැණුම් ලෙජරයෙන් මාරුකළ හර ශේෂ | | 12 |
| 2016.03.31 දිනට බැර ශේෂය | | 3 |

ii. 2016.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය විකුණුම් ලෙජර ශේෂ ලැයිස්තු ශේෂය සමග සම නොවිය. පසුව කරන ලද පරීක්ෂාවක දී පහත කරුණු අනාවරණය විය.

1. රු. 6000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මගහැරී ඇත.
2. රු. 2,000 ක ණය ගැති හර ශේෂයක් ශේෂ ලැයිස්තුවට ගෙන නැත.
3. ණයගැතියෙකුගෙන් ලද රු. 4,000ක් ලැබීම් ජ'නලයේ දෙවරක් සටහන් කර ඇත.
4. රු. 10,000 ක බොල් ණය කපාහැරීම විකුණුම් ලෙජරයේ සටහන් කර තිබූ නමුත් පාලන ගිණුමට ඇතුළත්ව නැත.
5. දුන් වට්ටම් තීරුවේ එකතුව රු. 1,000 ක් අඩුවෙන් එකතු කර ඇත.
6. ණයගැතියකු ආපසු එවුම් රු.21,000 ක් මූලික පොතේ රු. 12,000 ක් ලෙස සටහන් කර ඇත.

iii. 2015.04.01 දිනට අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුමේ රු. 40,000 ශේෂයක් වේ. බොල් හා අඩමාන ණය සඳහා තනි ගිණුමක් පවත්වා ගැනීම ව්‍යාපාර ප්‍රතිපත්තියයි. පෙර වර්ෂයක කපාහල බොල් ණය ආපසු ලැබීම රු. 5,000 යි. ණයගැතියන්ගෙන් 5% ක් අඩමාන ණය සඳහා වෙන් කිරීමක් පවත්වා ගන්න.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති පාලන ගිණුම
2. සංශෝධිත ණයගැති පාලන ගිණුම
3. සංශෝධිත ණයගැති පාලන ගිණුමේ ශේෂය, විකුණුම් ලෙජර ශේෂ ලැයිස්තු ශේෂය සමග සසඳුම් ප්‍රකශයක්.
4. 2016.03.31 න් අවසන් වර්ෂයේ බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීමේ ගිණුම. (ලකුණු 10 යි)

(ආ) i. "X" අමු ද්‍රව්‍යයේ වර්ෂයකට ඒකක 36,000 ක් අවශ්‍ය වන අතර, එක් ඇනවුමක පිරිවැය රු. 30 කි. තොග තබා ගැනීමේ වාර්ෂික පිරිවැය ඒකකයක් සඳහා රු. 3 කි.

අවශ්‍ය වන්නේ,

1. ආර්ථික ඇනවුම් ප්‍රමාණය
2. ඇනවුම් වාර ගණන

ii. "Y" ද්‍රව්‍යයට අදාළ ලැබීම් හා නිකුත් කිරීම් වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ලැබීම් ඒකක | ඒකක මිල (රු) | නිකුතු ඒකක |
|---|---|---|---|
| ජනවාරි 01 | 500 | 20.00 | |
| ජනවාරි 10 | 300 | 24.00 | |
| ජනවාරි 15 | | | 700 |
| ජනවාරි 20 | 400 | 28.00 | |
| ජනවාරි 25 | | | 300 |
| ජනවාරි 27 | 500 | 22.00 | |
| ජනවාරි 31 | | | 200 |

ඔබ විසින්,

1. පෙර පිවිසි පෙර නිකුතු (FIFO) ක්‍රමය අනුව "Y" තොග ලෙජර ගිණුම පිළියෙල කර අවසන් තොගයේ පිරිවැය ගණනය කරන්න. (ලකුණු 05 යි) (මුළු ලකුණු 15 යි)

05. (ආ) 2015/2016 අධ්‍යයන වර්ෂයේ වයඹ විශ්වවිද්‍යාලයේ නවක සිසුන් සඳහා හන්තාන කන්ද තරණය කිරීමට ජ්‍යෙෂ්ඨ සිසුන් විසින් සංවිධානය කර තිබුණි. ඒ සඳහා පහත තොරතුරු ඇස්තමේන්තු කර ඇත.

- එක් අයෙකුගේ ගමන් ගාස්තුව රු. 2,500 යි
- එක් අයකුගේ ආහාර වියදම රු. 200 යි.
- ආරක්ෂක කබායක් සඳහා එක් අයකුට රු. 150 යි.
- වතුර බෝතලයක් සඳහා රු. 50 යි.
- ටී ෂර්ට් එක් සඳහා රු. 450 යි
- විස්තර සටහන් කිරීමට අවශ්‍ය පොත් සහ අනෙකුත් දෑ සඳහා එක් අයකුට රු. 150 යි.
- බස් රථ 4ක් යොදා ගැනීමට නියමිත බැවින එක් බස් රථයකට රු 25,000 ක් බැගින් ගෙවීමට සිදු වේ.
- විනෝදය සඳහා සංගීත කණ්ඩායමක් හා ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට රු. 50 000 ක් වැය වේ.
- මෙම කණ්ඩායම දිනකට රු. 20,000 ක් බැගින් නවාතැන් පහසුකම් අවශ්‍ය යැයි පරිපාලන අංශය විසින් ප්‍රකාශ කර ඇති අතර මේ සඳහා නෙමිලේම අනුග්‍රහය දීමට පෞද්ගලික ආයතනයක් වූ ස්ලිම් ටෙක්ස් (SLIM TEX) ආයතනය ඉදිරිපත් වී ඇත.
- මෙම විනෝද චාරිකාවට නවකයින් 200 සහභාගි වීමට නියමිතය.

අවශ්‍ය වන්නේ,

පහත සඳහන් දෑ ගණනය කිරීම.

1. සහභාගි වන්නකුට අදාල දායකය
2. සමච්ඡේදන ලක්ෂ්‍ය සිසුන් සංඛ්‍යාව හා වටිනාකම

3. ආරක්ෂිත ආන්තිකය (සිසුන් සමතුලිතය)
4. 200 දෙනාම චාරිකාවට සහභාගි වන්නේ යැයි උපකල්පනය කර, චරිකාව හේතුවෙන් සංවිධායක මණ්ඩලයට ඉතිරිවන මුදල (ලාභය)
5. චාරිකාවට අදාල දළ සමච්ඡේදන සටහනක් ඇඳ ඉහත ගණනයන් දැක්වීම.
6. නවක සිසුන් විශ්වවිද්‍යාලයට අළුතින් බඳවාගත් අය නිසා ඇතමුන් චාරිකාවට සහභාගි වීමට කැමැත්තක් නොදක්වයි. එම නිසා සිසුන් 80 ක් පමණ චාරිකාවට සහභාගි වන්නේ නම් ඉහත4 හි ගණනය කළ ලාභය මත ඇතිවන බලපෑම (ලකුණු 10 යි)

(ආ) සීමිත අවිෂ්කා සමාගමේ මූල්‍ය ප්‍රකාශවලින් පහත සඳහන් තොරතුරු ලබා ගන්නා ලදි.

i. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

(රු.000)

| | | |
|---|---|---|
| විකුණුම් (සියළු විකුණුම් ණයට සිදුව ඇත) | | 1560 |
| විකුණුම් පිරිවැය | | (936) |
| දළ ලාභය | | 624 |
| වෙනත් ආදායම් | | 51 |
| | | 675 |
| වියදම් | | |
| මෙහෙයුම් වියදම් | 408 | |
| ක්ෂය වීම් | 52 | |
| පොලි වියදම් | 70 | |
| මෝටර් රථ විකිණීමේ අලාභය | 5 | (535) |
| බදු පෙර ලාභය | | 140 |
| වර්ෂයේ ආදායම් බදු | | (45) |
| කාලච්ඡේදයේ ලාභය | | 95 |

ii තෝරාගත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ අයිතම කිහිපයක් පහත දැක්වේ.

| අයිතම | 2015.03.31 (රු.000) | 2016.03.31 (රු.000) |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 540 | 500 |
| බඩු තොගය | 162 | 150 |
| ඉදිරියට ගෙවූ මෙහෙයුම් වියදම් | 150 | 100 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 566 | 490 |
| උපචිත පොලි | 40 | 10 |
| උපචිත ආදායම් බදු | 20 | -- |

**අවශ්‍ය වන්නේ,**

ඉහත තොරතුරු ඇසුරින් 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ ගණනය කිරීම.

1. දළ ලාභ අනුපාතය 2. තොග පිරිවැටුම් අනුපාතය 3. ජංගම අනුපාතය
4. පොලි ආවරණ අනුපාතය 5. ණය එකතු කිරීමේ කාලය (ලකුණු 05) (මුළු ලකුණු 15)

06. සීමිත සල්ගාදු පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන පහත දී ඇත.

සීමිත සල්ගාදු පොදු සමාගම 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(රු.000)

| | | |
|---|---|---|
| විකුණුම් | | 8300 |
| විකුණුම් පිරිවැය | | (4900) |
| දළ ලාභය | | 3400 |
| වෙනත් ආදායම් | | |
| ආයෝජන ආදායම් | | 120 |
| බෙදාහැරීමේ වියදම් | 900 | 3520 |
| පරිපාලන වියදම් | 1200 | |
| මූල්‍ය වියදම් | 100 | (2200) |
| බදු පෙර ලාභය | | 1320 |
| ආදායම් බද්ද | | (400) |
| කාලච්ඡේදය සඳහා ලාභය | | 920 |

සීමිත සල්ගාදු සමාගම 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

| | 2016 (රු.000) | 2015(රු.000) |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | 7500 | 6000 |
| ඉඩම් | 8000 | 8000 |
| ගොඩනැගිලි පිරිවැය | (1200) | (1000) |
| ගොඩනැගිලි සමුච්චිත ක්ෂය | 4900 | 2500 |
| මෝටර් රථ - පිරිවැය | (1300) | (750) |
| මෝටර් රථ සමුච්චිත ක්ෂය | 1000 | 1000 |
| ආයෝජන | | |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 800 | 1100 |
| ණයගැතියෝ | 1200 | 1000 |
| මුදල් | 600 | 400 |
| | 21500 | 18250 |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය කොටස් | 15000 | 12000 |
| **සංචිත** | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | 500 | - |
| රඳවාගත් ඉපැයුම් | 2300 | 2000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| දිගුකාලීන ණය | 2500 | 3000 |
| **ජංගම වගකීම්** | | |
| ණය හිමියෝ | 880 | 1030 |
| ගෙවිය යුතු පොලී | 50 | 60 |
| ගෙවිය යුතු ආදායම් බදු | 200 | 100 |
| උපචිත වියදම් | 70 | 60 |
| | **21500** | **18250** |

අතිරේක තොරතුරු.

- i. සමාගමේ ඉඩම් 2015.04.01 දින ප්‍රථම වතාවට ප්‍රත්‍යාගණනය කළ අතර එහිදී ප්‍රත්‍යාගණන ලාභයක් ඇති විය. වර්ෂය තුළදී ඉඩමක් මිළදී ගෙන ඇත.
- ii. වර්ෂය තුළදී මෝටර් රථයක් මිළදී ගෙන ඇත.
- iii. සමාගම 2015.06.30 දින සාමාන්‍ය කොටස් 30000 ක් එකක් රු.100 බැගින් නිකුත් කර ඇත.
- iv. ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් තුළ ඇතුළත්ව ඇත්තේ වර්ෂයට අදාළ බැංකු ණය පොලියයි.
- v. සමාගම වර්ෂය තුළ අතුරු ලාභාංශ ගෙවා ඇත.
- vi. සියළුම විකුණුම් හා ගැණුම් ණය පදනම මත සිදුකරනු ලබයි.

**අවශ්‍ය වන්නේ,**

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) -07 ට අනුව 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඍජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (ලකුණු 15)

07. (අ) ''දිලෙන තරු'' ක්‍රීඩා සමාජයේ 2014/2015 හා 2015/2016 ගිණුම් වර්ෂවලට අදාල පහත තොරතුරු ඔබට සපයයි.

i. ''දිලෙන තරු'' ක්‍රීඩා සමාජයේ 2015.03.31 හා 2016.03.31 දිනෙන් අවසන් වර්ෂවල ආදායම් හා වියදම් ගිණුම

ii.

| | 2014/2015 | 2015/2016 |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 12,000 | 11,640 |
| සාමාන්‍ය පරිත්‍යාග | | 4,000 |
| පරණ පත්තර අලෙවි ආදායම | 300 | 500 |
| | 12,300 | 16,140 |

| | | |
|---|---|---|
| **අඩුකලා - වියදම්** | | |
| ක්‍රීඩා භාණ්ඩ ක්ෂයවීම | (2,500) | (4,000) |
| කපාහල සාමාජික මුදල් | | (360) |
| සේවක වැටුප් | (6,000) | (8,000) |
| ලිපි ද්‍රව්‍ය | (500) | (1,000) |
| පත්‍ර මිලට ගැනීම | (1,500) | (2,500) |
| අතිරික්තය | 1,800 | 280 |

iii. ''දිලෙන තරු'' ක්‍රිඩා සමාජයේ 2015.03.31 දිනට හා 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන්,

| | 2014/2015 දිනට | 2015/2016 දිනට |
|---|---|---|
| ක්‍රීඩාගාරය | | 10,000 |
| ක්‍රීඩා උකරණ (ධාරණ අගය) | 25,000 | 30,000 |
| ලැබීය යුතු සාමාජික මුදල් | 2,400 | 2,040 |
| බැංකු ශේෂය | 5,000 | (3,960) |
| | 32,400 | 38,080 |
| සමුච්චිත අරමුදල (ආරම්භක දිනට) | 9,760 | 11,200 |
| ක්‍රීඩාගාර අරමුදලින් මාරුකිරීම | | 10,000 |
| අතිරික්තය | 1,800 | 280 |
| සමුච්චිත අරමුදල (අවසන් දිනට) | 11,200 | 21,480 |
| ක්‍රීඩාගාර අරමුදල | 20,000 | 16,000 |
| ඉදිරියට ලද සාමාජික මුදල් | 1,200 | 600 |
| | 32,400 | 38,080 |

iv. 2015.03.31 දිනට සංගමයේ සාමාජික 120 කි. මාසික සාමාජික මුදල රු. 10 කි.

**අවශ්‍ය වන්නේ,**

1. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුම්
2. 2015.03.31 දිනට රු. 5,000 ක තැන්පතු ශේෂයක් පැවතුනත් 2016.03.31 ට එය රු. 3,960 ක අයිරාවක් බවට පත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 10 යි)

(ආ) සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යනු ලබන සිදත් අමතර ආදායමක් ලබා ගැනීම සඳහා ඡායාපිටපත් යන්ත්‍රයක් මිල දී ගැනීම පිළිබඳ සළකා බලමින් සිටියි. මෙම අවශ්‍යතාවයකට ගැලපෙන ඡායාපිටපත් යන්ත්‍ර වර්ග දෙකක් (එනම් P වර්ගය හා Q වර්ගය) ඔහු විසින් හඳුනාගෙන ඇත. P යන්ත්‍රයේ පිරිවැය රු. 220,000 ක් වන අතර Q යන්ත්‍රයේ පිරිවැය රු. 240,000 ක් වේ. මෙම යන්ත්‍රවලින් අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහයන් පහත දැක්වේ.

| | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර |
|---|---|---|---|---|
| P යන්ත්‍රය | රු 100,000 | 80,000 | 40,000 | 60,000 |
| Q යන්ත්‍රය | රු 120,000 | 100,000 | 80,000 | 20,000 |
| 10% වට්ටම් සාධකය | 0.9 | 0.8 | 0.7 | 0.6 |

**අවශ්‍ය වන්නේ,**

1. එක් එක් යන්ත්‍රයේ පිළිගෙවුම් කාලය 2. එක් එක් යන්ත්‍රයේ ශුද්ධ වර්තමාන අගය
3. ශුද්ධ වර්තමාන අගය මත කුමන යන්ත්‍රය මිල දී ගැනීම වඩාත් යෝග්‍ය වේ ද? හේතුව දක්වන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

***